# ගිණුම් ප්‍රතිපත්ති හෙළි කිරීම

- සභාවේ 2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 01 සහ 07 ට අනුව සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

- සභාවේ ගනුදෙනු සහ සිද්ධීන් වාර්තා කිරීමේ දී 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 171 වෙනි වගන්තියට අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා උප නීතීන් වශයෙන් සම්මත කර ඇති 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතීන් වලට අනුගත වෙමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

- සභාවේ ස්ථාවර වත්කම් ගිණුම් ගත කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතවල නිර්දේශවලින් බැහැරව වත්කම් මිල දී ගත් වර්ෂයේ 100% ක්ෂය වූවාසේ සලකා මුළු පිරිවැය ආදායම් හා වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් යටතේ ලියා හැර ඇති අතර අදාල වත්කම ශේෂ පත්‍රයේ නිරූපනය කිරීම සඳහා අදාල වත්කම් ගිණුමට හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම හිමිකම් ගිණුමට සිහිවටන සටහනක් මඟින් නිරූපනය කර ඇත.

- සභාව විසින් ප්‍රාදේශීය සභා පනතේ දක්වා ඇති සේවාවන් ඉටු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය මඟින් ලියා හැර ඇත.

- සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී පිරිවැය මත ගිණුම් ගත කර ඇති අතර උද්ධමනකාරී හෝ අවධමනකාරී තත්වයන් සැලකිල්ලට ගෙන නොමැත.

- ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුව සභාවේ තොග අගය කිරීම ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය මත අගය කර ඇත.

- සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අනුව සියළු ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් තැබීම සිදු කර ඇත.